**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව**

සතිය - 03

ශ්‍රේණිය - 6

විෂය - චිත්‍ර කලාව

සැකසුම - තමාලි පරණගම

මාවනැල්ල අධ්‍යාපන කලාපය

**නිපුණතාවය :- 1.0 පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම :- 1.2 ස්වභාවික හා නිර්මිත පරිසරය ඇසුරෙන් චිත්‍ර සංරචනය කරයි.**

**ක්‍රියාකාරකම :- " ආගමික වතාවක් " යන මාතෘකාවට චිත්‍රයක් නිර්මාණය කර වර්ණ ගන්වන්න.**

විවිධ තේමා යටතේ චිත්‍ර නිර්මාණය කිරීමට ප්‍රථම මානව ක්‍රියාකාරකම් පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය. ආගමික වතාවක් යන මාතෘකවට චිත්‍ර නිර්මාණය කිරීමේදී පහත ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කරන්න.

- විවිධ පරිසර තත්ත්වයන් යටතේ ( බෞද්ධ/ හින්දු/ ඉස්ලාම්/ ක්‍රිස්තියානි ආගමික ස්ථානයක් ලෙස ) තේමා වෙන් වුවද බොහෝ විට මානව ක්‍රියාකාරකම් හා චලනයන් වල සමානකම් මෙන්ම සමාන නොවන අවස්ථාද ඇත. එකී විවිධත්වය චිත්‍ර නිර්මාණයේදී අවබෝධ කරගත යුතුය.

  උදාහරණයක් ලෙස බෞද්ධ සිද්ධස්ථානයකට ගොස් බෞද්ධ බැතිමතුන් බෝධි පූජාවක් පවත්වන ආකාරයට වඩා වෙනස් ආකාරයට ඉස්ලාම් බැතිමතුහු පල්ලියට ගොස් යාඥා කරනු ලබති. එහිදී සමහර මිනිස් ඉරියව්වල සමානකම් මෙන්ම අසමානකම්ද දැකිය හැක. මෙකී අවස්ථාවක මානව රූපවල ඇඳුම් පැළඳුම් සහ භාවිත මෙවලම් වෙනස් වන ආකාරය ද නිරීක්ෂණය කළ හැකිය. පහත ඡායාරූප දෙස බලන්න. ක්‍රියාකාරකමේ නිරතවන්න.





ක්‍රිස්තියානි දේවස්ථානයක ආගමික වතාවත්වල නිරතවන බැතිමතන්

බෞද්ධ සිද්ධස්ථානයක ආගමික වතාවත්වල

නිරතවන බැතිමතන්





හින්දු බැතිමතුන් විසින් ආගමික වතාවත්වල නිරත වන අවස්ථාවක්



ඉස්ලාම් බැතිමතුන් විසින් ආගමික වතාවත්වල නිරත වන අවස්ථාවක්